සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 61 S I,II

නම: .............................................. | භූගෝල විද්‍යාව | කාලය පැය දෙකයි

- **සැලකිය යුතුයි.**
- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01) පෘථිවි ආදර්ශ ගෝලයේ දකුණු අක්ෂාංශ අංශක 23.5 රේඛාව ............................... නිවර්තනය ලෙස හඳුන්වයි.
(මකර / ආක්ටික් / කර්කටක)

02) අක්ෂාංශ හා දේශාංශ පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම ................................. පිහිටීම ලෙස හඳුන්වයි.
(සාපේක්ෂ / නිරපේක්ෂ / නිශ්චිත)

03) ශ්‍රී ලංකාවේ නිරිත දිග හා බටහිර බෑවුම් ප්‍රදේශවල ..................................... කලාපීය භූදර්ශනයක් දැකිය හැකිය.
(කඳුකර / වියළි / තෙත්)

04) ශ්‍රී ලංකාවේ උපරිම දිග වන කිලෝමීටර .................................. ඇත්තේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා ය.
(224 / 432 / 342)

05) අසනි වැසි, සවස්කළ වැසි ලෙස හඳුන්වන්නේ ....................................... වර්ෂාවයි.
(සංවහන / මෝසම් / වාසුළි)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06) කැස්පියන් මුහුද ආසියා මහාද්වීපය තුළ පිහිටා ඇත. (   )

07) ආක්ටික් සාගරය ලෝකයේ කුඩාම සාගරය යි. (   )

08) ශ්‍රී ලංකාව සමකයට ආසන්නව සෞම්‍ය කලාපය තුළ පිහිටි රටකි. (   )

09) වර්ෂාව පවතින අවස්ථාවල උස් ගසක් යට සිටීමෙන් අකුණු අනතුරු වළක්වා ගත හැකිය (   )

10) හින්දු ආගමික පූජස්ථානයක් වන නල්ලූර් කෝවිල උතුරු ප්‍රදේශයේ පිහිටා ඇත. (   )

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11) ශ්‍රී ලංකාවේ ...................................................................... සිට සංගමන් කන්ද තුඩුව දක්වා පළල කිලෝමීටර 224 කි.

12) දකුණු ආසියාවට අයත් රටවල් අතරින් විශාලම රට ............................................. යි.

13) වියළි කලාපීය භූ දර්ශනය තුළ කුඩා හෙල්වැටි අතරින් ගලාබසින ගංගා හරස්කර .................................. ඉදිකර තිබේ.

14) සුළි සුළං මගින් වැඩි බලපෑමක් එල්ල වන්නේ දිවයිනේ උතුරු හා ............................... ප්‍රදේශ වලට ය.

15) දේශාංශ 180° රේඛාව ................................................ රේඛාව ලෙස හඳුන්වයි.

• **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අදින්න.**

16) භූමියේ උස මීටර් 30 ට වඩා අඩු ප්‍රදේශ අයත් වන්නේ,
1. වෙරළ බඩ තැන්නට ය
2. මධ්‍යම කඳුකරයට ය
3. අභ්‍යන්තර තැන්නට ය
4. වියළි කලාපයට ය

17) ඊසාන දිග මෝසම ක්‍රියාත්මක වන කාලසීමාව වන්නේ,
1. මැයි සිට සැප්තැම්බර් දක්වා ය
2. නොවැම්බර් සිට ජනවාරි දක්වා ය
3. මාර්තු සිට අප්‍රේල් දක්වා ය
4. ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ය

18) ශ්‍රී ලංකාවට අයත් රාෂ්ට්‍රීය මුහුදු සීමාව වෙරළේ සිට නාවික සැතපුම් ........................................
1. 24 කි 2. 200 කි 3. 22 කි 4. 12 කි


19) ගෝලීය උණුසුම වැඩි කරන වායු ................................................ වායු ලෙස හඳුන්වයි.
1. ස්ථිර 2. දූෂක 3. හරිතාගාර 4. විචල්‍ය

20) ශ්‍රී ලංකා පාසල් සිතියම් සංග්‍රහ මුද්‍රණය කර ඇත්තේ,
1. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගිනි
2. මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගිනි
3. ආරක්ෂක දෙපාර්තමේන්තුව මගිනි
4. පරිසර අමාත්‍යාංශය මගිනි

## II කොටස


• **සැ.යු.**
• **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
• **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
• **පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසියක් යොදා ගන්න.**

01) (අ) පහත දැක්වෙන ලෝක ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





i) දකුණු ඇමරිකා මහාද්වීපය දැක්වෙන අක්ෂරය කුමක් ද?
ii) මැඩගස්කර් දූපත දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?
iii) ආක්ටික් සාගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?
iv) සේයාකර ඇති රටවල් දෙක අතරින් චීනය දැක්වෙන අක්ෂරය කුමක් ද?
v) K අක්ෂරයෙන් දැක්වෙන මුහුද නම් කරන්න.
vi) M අක්ෂරයෙන් දැක්වෙන ප්‍රධාන අක්ෂාංශ රේඛාව කුමක් ද? (ල. 06)

(ආ) යාබද ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i) පේදුරුතුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද?
ii) කැලණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?
iii) නැගෙනහිර දේශාංශ $80^{0}$ රේඛාව දැක්වෙන අක්ෂරය කුමක් ද?
iv) J අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක් ද?
v) K අක්ෂරය යොදා කඩඉරි මගින් දක්වා ඇති සමුද්‍ර සන්ධිය කුමක් ද?
vi) L අක්ෂරයෙන් දැක්වෙන වනෝද්‍යානය කුමක් ද? (ල. 06)

(ඉ) i) ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් ඇඳ ඇති පරිමාණය කුමක් ද?
ii) සිතියමක් මගින් ලබා ගත හැකි ප්‍රයෝජනයක් සඳහන් කරන්න.
iii) සිතියමක අන්තර්ගත වියයුතු මූලිකාංග දෙකක් සඳහන් කරන්න. (ල. 04)




02) i. යාබද සිතියමේ අංක 1, 2 හා 3 න් දක්වා ඇති භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ල. 03)
ii. අංක 3 කලාපයේ හඳුනාගත හැකි භූ විෂමතා ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 03)
iii. (a) අංක 1 න් දැක්වෙන කලාපයේ භූ දර්ශනය ආශ්‍රිතව සිදු කෙරෙන කර්මාන්ත තුනක් සඳහන් කරන්න.
(b) මෙම භූ දර්ශනයට හානි පමුණුවන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ල. 05)

03) i. ශ්‍රී ලංකාව බහු වාර්ගික හා බහු ආගමික රටක් ලෙස හඳුන්වන්නේ ඇයිදැයි සඳහන් කරන්න. (ල. 02)
ii. (a) ලෝක උරුම බෙදා දක්වන ප්‍රධාන අංශ දෙක සඳහන් කරන්න.
(b) ඉහත අංශ දෙකට අයත් වන ශ්‍රී ලාංකීය උරුමයන් එක බැගින් දක්වන්න. (ල. 04)
iii. (a) ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනයාගේ ජීවනෝපාය මාර්ග දෙකක් සඳහන් කරන්න.
(b) වර්තමානයේ ආදිවාසී ජනයාගේ ජීවන රටාවේ සිදුවී ඇති වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ල. 05)

04) i. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය භූ දර්ශනයට අයත් වන නගර දෙකක් සඳහන් කරන්න. (ල. 02)
ii. (a) තෙත් කලාපීය භූ දර්ශනයේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(b) තෙත් කලාපයේ සජීවී භූ දර්ශනයක් ඇතිවීමට බලපා ඇති හේතුවක් ලියන්න. (ල. 03)
iii. තෙත් කලාපීය භූ දර්ශනයේ ලක්ෂණ ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 06)

තෙත් කලාපීය භූ දර්ශනය

| වගා කරන භෝග | නිදහස් වෙළඳ කලාප පිහිටි ප්‍රදේශ | බලපාන ස්වාභාවික උපද්‍රව |
|---|---|---|
| 1.<br>2. | 3.<br>4. | 5.<br>6. |

05) • භූමිකම්පා • නියඟය • ගිනිකඳු • ගංවතුර • ලැව්ගිනි • නායයාම්
i. ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික උපද්‍රව දෙකක් ඉහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා ලියන්න. (ල. 02)
ii. (a) ශ්‍රී ලංකාවේ සුළි සුළං බලපෑමට ලක්වන දිස්ත්‍රික්ක දෙකක් සඳහන් කරන්න.
(b) අකුණු අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 04)
iii. (a) ආපදා කළමනාකරණයේ මූලිකාංග තුන සඳහන් කරන්න.
(b) ඉහත ඔබ සඳහන් කළ එක් අවස්ථාවක් තෝරා ගෙන එහිදි කටයුතු කළයුතු ආකාරය පිළිබඳව කරුණු දෙකක් ලියන්න. (ල. 05)


06) i. දේශගුණික වෙනස්වීම් ලෙස හැඳින්වෙන්නේ කුමක් ද? (ල. 03)

ii. දේශගුණික වෙනස්වීම් ඇතිවීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii. (a) වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාම නිසා ශ්‍රී ලංකාවට ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න.

(b) දේශගුණ වෙනස්වීම් අවම කරගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල. 05)

07) i. යාබද සිතියමේ අංක 1, 2 හා 3 න් දක්වා ඇත්තේ සිතියමක් පරිහරණය කිරීමේ දී අවධානය යොමු කළයුතු මූලිකාංග තුනකි. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ල. 03)




ii. සිතියමක් පිටලස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හතරක් සඳහන් කරන්න. (ල. 04)

iii. සිතියමක් පිටලස් කිරීමේ දී අනුගමනය කළයුතු පියවර පිළිවෙලින් සඳහන් කරන්න. (ල. 04)